19

# සීරතුන් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම්- I

## නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණන්ගේ මදීනා ජීවිතය

මක්කා මුස්ලිම්වරුන් හට තම සතුරන්ගෙන් කරදර හා වද හිංසා වැඩිවන්නට පටන්ගත්තේ ය. මේ අවස්ථාවේ ඉස්ලාම් ආගම නිදහස් ව පිළිපැදීමට ආරක්ෂිත ස්ථානයක් වෙත යාමට අවශ්‍යතාවක් ඇති විය. නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණෝ මෙයට සුදුසු ම ස්ථානය ලෙස මදීනාව තෝරා ගත්හ. එම නිසා මක්කාවේ සිටි මුස්ලිම්වරු තනි තනි ව ද කණ්ඩායම් වශයෙන් ද මදීනාව වෙත පිටත් කරවන ලදී. අන්තිමට නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමා හා අබූබක්කර් රළියල්ලාහු අන්හු තුමාත්, කුරෛෂිවරුන්ගේ විරෝධතාව මැද මක්කාවට දකුණින් පිහිටි "සෞර්" නම් ගුහාව කරා ළඟා වූහ. එහි දින 3ක් නතර වීමෙන් පසු කුබාවටත් එහි සිට මදීනාවටත් ආරක්ෂිත ව පැමිණියෝ ය.

නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාගේ මදීනා ජීවිතය හිජ්රත් සිදුවීම් සමඟ ම ආරම්භ විය. හිජ්රතය යනු මක්කාවේ සිටි මුස්ලිම්වරු තම නෑදෑයන් ,ගෙවල් දොරවල් ,ඉඩකඩම් හා තම ධනය, උපන් භූමිය අත්හැර මදීනාවේ පදිංචි වූහ. මෙම හිජ්රතයෙන් පසු ව මදීනාවේ ඉස්ලාමීය රාජ්‍යයක් බිහිවුණි. හිජ්රතය ඉස්ලාමීය ඉතිහාසයේ වැදගත් සිද්ධියක් ලෙස සඳහන් වේ. ඉස්ලාමීය වර්ෂයත් හිජ්රතය මුල්කොට ගණන් ගනු ලබයි.

## මස්ජිදුන් නබවියෙහි නිර්මාණය

මදීනාවට ගිය නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමා ඉටුකළ මුල් ම කාර්යය වූයේ මස්ජිදුන් නබවිය නිර්මාණය කිරීමයි. තමන්ගේ ඔටුවා ගොස් වාඩි වූ ස්ථානයේ මස්ජිදය තැනීමට සුදුසු ස්ථානය යැයි නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමා නිගමනය කළේ ය. නබි තුමා එම ස්ථානය මිල දී ගෙන ඉතාමත් චාම් ලෙස තමාගේ මිතුරන් සමඟ එකතු වී මස්ජිදය නිර්මාණය කළේ ය.

මදීනාවට ගිය පසු පස්වේල් ජමාඅත් සලාතය (එක්රැස් වී ඉටුකරන) මුස්ලිම්වරුන් හට අනිවාර්ය කරන ලදි. බිලාල් රළියල්ලාහු අන්හු තුමා අදාන් පවසා ජනතාව පස්වේල් සලාතය සඳහා කැඳෙව්වේ ය. මස්ජිදුන් නබවිය මුස්ලිම්වරුන්ගේ කේන්ද්‍රස්ථානය ලෙස තිබුණි. ජමාඅත් සලාතය එහි දී ඉටුකෙරුණි. එම නිසා සැමට ම එක් ස්ථානයක විටින් විට හමු වී සැපදුක් විමසීමට ද මඟක් පෑදුණේ ය.සමාජයේ ඇතිවන ප්‍රශ්න නිරාකරණය කිරීමේ ස්ථානයක් ලෙස මස්ජිදුන් නබවිය ක්‍රියා කරන ලදි.

පිටරටවලින් පණිවිඩ රැගෙන එන අය පිළිගෙන භෝජන සංග්‍රහ ද පැවැත්වුණි. දුප්පත් අයට ද හදිසි අවශ්‍යතා තිබෙන අයට ද පිහිටවීමේ ස්ථානයක් ලෙසත් සමාජයේ වැසියන්ට දැනුම ව්‍යාප්ත කරන ස්ථානයක් ලෙසත් මස්ජිදුන් නබවිය නම් කෙරේ. මෙසේ බොහෝ සේවා ඉටු කරන මධ්‍යස්ථානයක් ලෙස මස්ජිදුන් නබවිය භාවිත කෙරුණි. තව ද බොහෝ ක්‍රියා ඉටුකර දෙන සංස්කෘතික මධ්‍යස්ථානයක් ලෙස ද නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමා නිර්මාණය කළ මස්ජිදුන් නබවිය හැඳින්විය හැකි ය.

## මුහාජිර්වරුන් හා අන්සාරිවරුන් අතර සහෝදරත්වය ඇති කිරීම

මක්කාවේ සිට මදීනාවට හිජ්රත් ගිය අය මුහාජිර්වරු යනුවෙන් ද ඔවුන් පිළිගෙන සෙනෙහස දැක්වූ මදීනා වැසියන් අන්සාරිවරු යනුවෙන් ද අමතන ලදී. මුහාජිර්වරුන්ට උදවු උපකාර කිරීමට මදීනා මුස්ලිම් වැසියෝ තම තමන් අතර තරග කර ගත්හ. මොවුන් ගැන අල්කුර්ආනයේ ද ප්‍රශංසා කර ඇත.

නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණෝ මදීනාවට ගිය පසු මුහාජිර්වරුන් හා අන්සාරිවරුන් අතර සහෝදර බැඳීමක් ඇති කළහ. මෙම සහෝදරත්ව බැඳීම ඉස්ලාමය වර්ධනය වීමට අවශ්‍ය වන බව නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමා ස්ථිර ව ම විශ්වාස කළේ ය. මේ නිසා පෙර තිබුණාක් මෙන් සෙනෙහස හා වටහාගැනීමේ හැකියාව තව දුරටත් වර්ධනය විය. සියලු මුහාජිර්වරු අන්සාරිවරුන් සමග සම්බන්ධකම් පවත්වා ගත්හ. මේ නිසා අන්සාරිවරු තමන් සතු ව තිබූ ඉඩකඩම් වෙළෙඳාම් හා අනෙකුත් දෑ තම අලුත් සහෝදරයින්ට බෙදා දුන්හ. මෙවන් සහෝදර බැඳීමක් ලොව ඉතිහාසයේ මෙතෙක් දැකගත නොහැකි විය.

අන්සාරිවරුන් තමන් සතු ව තිබූ දෑ බෙදා දීමට ඉදිරිපත් වූවත් මුහාජිර්වරු ඒ සියල්ල ලබා ගැනීමට පසුබැස්සෝ ය. තම සහෝදරයන්ට එය කරදරයක් වේ යැයි සිතා මෙසේ කිරීමට ඔවුහු පෙළඹුණෝ ය.

සෑද් බින්ද් රබිඋ රළියල්ලාහු අන්හු යන අන්සාරිවරයා තම මුළු දේපළෙන් බාගයක් මුහාජිර් සහෝදර අබ්දුර් රහ්මාන් බින් අවුෆ් රළියල්ලාහු අන්හු තුමාට මුළු හදවතින් ම දීමට ඉදිරිපත් වූවේ ය. එම අවස්ථාවේ අබ්දුර් රහ්මාන් බින් අවුෆ් රළියල්ලාහු අන්හු තුමාණෝ "මිත්‍රයාණෙනි! ඔබේ පවුලටත් ධන සම්පතටත් අල්ලාහ් සැමදා අභිවෘද්ධිය ලබාදෙත්වා ! මට නුඹේ වෙළඳාමෙන් බාගයක් නොදෙන්න. වෙළඳාම් කරන ස්ථානය පෙන්වා දෙන්න. මම වෙළඳාම් කර ජීවත් වෙන්නම්," යැයි මුළු හදවතින් ම කීහ. මොවුහු පසුකාලයේ මදීනාවේ පොහොසතුන් බවට පත්වූහ.

## අභ්‍යාස

1) ඉස්ලාමීය වර්ෂය ගණනය කරනු ලබන්නේ කුමන සිදුවීමෙන් ද?

2) මුහාජිර් හා අන්සාරි යන අය කවුරු ද?

3) මුස්ලිම්වරුන් මක්කාවේ සිට මදීනාවට හිජ්රත් යාමට හේතු වූ කරුණු දෙකක් සඳහන් කරන්න.

4) මස්ජිදයකින් සමාජයට කොපමණ සේවයක් කළ හැකි දැයි පහදන්න?

5) මක්කා වැසියන් සමඟ මදීනා වැසියන් හැසිරුණු ආකාරය විස්තර කරන්න.

6) මදීනාවේ පැරණි නම කුමක් ද? එක් මස්ජිදයකින් සමාජයට කොපමණ සේවයක් කළ හැකි ද?